# සංස්කෘත භාෂාවේ අතිශයාර්ථ
# ආඛ්‍යාතය - යඞන්ත හා යඞ්ලුගන්ත

**කණුමුල්දෙණියේ චන්දසෝම හිමි**

ශතවර්ෂ ගණනාවක් භාවිත වූ මෙන්ම වර්තමානයේද භාවිත වන සංස්කෘත භාෂාවේ ආඛ්‍යාත පද්ධතිය ඉතා සංකීර්ණ වූවකි. එහෙත් ක්‍රමානුකූල අධ්‍යයනයෙන් තත් විෂය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ලබා ගැනීම අපහසු නොවේ. හැඳින්වීමක් ලෙස තේරුම් ගත යුතු වන්නේ සංස්කෘත භාෂාවේ ආඛ්‍යාතයන් වර්ග දෙකකට බෙදෙන බවයි. එනම් ප්‍රාථමික ක්‍රියා හා අප්‍රාථමික ක්‍රියා වශයෙනි. ප්‍රාථමික ක්‍රියා ගණයට ගැනෙන්නේ දශ ලකාර පද්ධතියයි. එම ලකාරයන් ද කොටස් දෙකකට නැවත බෙදේ. එනම් කාලවාචී හා ප්‍රකාර වාචී වශයෙනි.

කාලවාචී ලකාර (tenses):

ලට්- වර්තමාන කාලය

ලිට්- නොදුටු (පරෝක්ෂ) අතීත කාලය

ලඞ්- ඇත (අනද්‍යතන) අතීත කාලය



ලුඞ්- සමීප (අද) අතීත කාලය

ලෘඞ්- අතීත/ අනාගත ක්‍රියාතික්‍රම (සම්භාව්‍ය) කාලය

ලුට්- හෙට (ශ්වස්තනී) අනාගත කාලය

ලෘට්- අනාගත කාලය

ප්‍රකාරවාචී ලකාර (moods):

ලෝට්- ආඥාව හා ප්‍රේරණය

විධිලිඞ්- විධාන හා සම්භාවනා ආශීර්ලිඞ්- ආශීර්වාදය

වශයෙනි.

සංස්කෘත ව්‍යාකරණයේ ලකාර නම් වූ ප්‍රාථමික ක්‍රියාවන්ට අමතරව අප්‍රාථමික (ද්විතීයික) ක්‍රියා පද්ධතියක් ද ඇත. එම ක්‍රියාවන්හි විශේෂ ලක්ෂණය නම් ධාතුවට විශේෂ ප්‍රත්‍යයක් එක්කොට ද්විතීයික ධාතු අංගයක් හෙවත් ක්‍රියා අංගයක් නිර්මාණය කරගැනීමයි. එවැනි අප්‍රාථමික ක්‍රියා කොටස් 04 කි. එනම්

1. ණිජන්ත (ප්‍රයෝජ්‍ය) ක්‍රියා
2. යඞන්ත (අතිශයාර්ථ) ක්‍රියා
3. සාන්ත (ඉච්ඡාර්ථ) ක්‍රියා
4. නාමධාතුක (නාම ක්‍රියා) ක්‍රියා වශයෙනි. (වෙනත් ලේඛනයකදී මේ හැඳින්වීම ලබා දී ඇත- ණිජන්ත ක්‍රියා බලන්න). මෙහිදී 'යඞන්ත ක්‍රියා' පිළිබඳ විමසා බැලේ.

නැවත නැවත හා වඩ වඩා යන අර්ථ දීම සඳහා නිපදවා ගනු ලබන ආඛ්‍යාත විශේෂය යඞන්ත (යඞ්+අන්ත) නමින් හඳුන්වනු ලැබේ. එනම් මූලික ධාතුවෙන් ප්‍රකාශ කෙරෙන ක්‍රියාවෙහි පෞනඃපුන්‍යය හෝ අතිශය භාවය ඇඟවීම සඳහා භාවිත කෙරෙන ආඛ්‍යාත විශේෂයකි.

වරාගොඩ පේමරතන හිමි සංස්කෘත ආඛ්‍යාත පද්ධතිය රූප සටහනක් ලෙස දක්වා (පි. 101) එහි ඒකක ප්‍රභේද යටතේ සියලුම අප්‍රාථමික ක්‍රියාවන් 'අර්ථක්‍රියා' ලෙස නම් කරයි. එහි යඞන්ත ක්‍රියා අතිශයාර්ථ ක්‍රියා වශයෙන් නම් කොට ඇත. මේ අතර ආධුනික සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයේ සියලුම අප්‍රාථමික ක්‍රියා 'උද්ධාරක ක්‍රියා' (Derivative verbs) යටතේ දක්වා ඇති අතර මෙම ක්‍රියා විශේෂය 'අතිශයාර්ථ ක්‍රියා' (Intensives/ Frequentatives) නමින්ම හඳුන්වා ඇත. ඉහත ග්‍රන්ථයේදී අතිශයාර්ථ ක්‍රියාවේ ස්වභාවය ඉතා සරළ ආකාරයෙන් පැහැදිලි කරයි. එනම් සරල ධාතුවෙකින් ප්‍රකාශ වන ක්‍රියාවෙක නිත්‍ය පුනරුක්තය හෝ අතිශයීකාරය පළ කිරීමට මේ ධාතුන් (ක්‍රියාවන්) යොදා ගන්නා බවයි. ව්‍යඤ්ජනාදික ඒකශබ්දවත් ක්‍රියාවන් පමණක් අතිශයාර්ථ ක්‍රියාවන් බවට පෙරළිය හැකි බව තවදුරටත් තත් ග්‍රන්ථය විස්තර කරයි. එසේම නැවතත් ධාතුන් 60 පමණ සංස්කෘත භාෂාවෙහි අතිශයාර්ථ ක්‍රියා උපදවන බව ද තවදුරටත් දක්වයි. එසේම මේ ක්‍රියා විශේෂය 'අතිශයාර්ථ ක්‍රියා' නාමයෙන් හැගොඩ ධම්මින්ද නාහිමි ද හඳුන්වයි. ඒ අතිශයාර්ථය ද දෙවැදෑරුම් බව උන්වහන්සේ දක්වති. එනම්

1. භෘශාර්ථය- බොහෝ සෙයින් වෙයි/ කරයි,
2. පෞනඃ පුන්‍ය- නැවත නැවත වෙයි/ කරයි යන

අර්ථයෝ වෙති.



ඉහත දැක් වූ සියලු අප්‍රාථමික ක්‍රියාවන් 'ප්‍රත්‍යයාන්ත ක්‍රියා හෙවත් අප්‍රාථමික' ලෙස ඇම්. එච්. එෆ්. ජයසූරිය මහතා විසින් නම් කොට, එයින් යඞන්ත ක්‍රියාවෝ 'පෞනඃපුන්‍යාර්ථ හෙවත් අතිශයාර්ථ ආඛ්‍යාතය' ලෙස නම් කෙරෙති. ඇම්. එච්. එෆ්. ජයසූරිය මහතා සඳහන් කරන පරිදි පෞනඃපුන්‍යාර්ථ ආඛ්‍යාතය මෑත ලෞකික භාෂාවේ විරල භාවිතයකි. එසේම පැරණි වෛදික භාෂාවෙහි ද ඒවා එතරම් ප්‍රචලිත නොවන බව ද සඳහන් කෙරේ. ඍග්වේදයේ ඇත්තේ ආඛ්‍යාත 85 ක් පමණි.

සමස්තයක් ලෙස ගත්විට ඉහත විද්වතුන් විසින් දක්වා ඇති පරිදි යඞන්ත ආඛ්‍යාතයේ විශේෂත්වය මෙසේය.

- අදාළ ධාතුව ඒක ස්වරයකින් ආරම්භවීම හෝ ව්‍යඤ්ජනයකින් අවසන්වීම හෝ වේ.
  චි (රැස්කිරීම), හි (පිරිහීම), ක්‍රී (මිළට ගැනීම), රු (හැඬීම), කෘ (කිරීම), හෘ (ගෙන යාම) ආදිය ඒක ස්වර ධාතුන්ට නිදර්ශන වේ. එසේම ව්‍යඤ්ජනයකින් අවසන්වීම යනු පච් (පිසීම), පය් (කියවීම), ගම් (යාම), ලිහ් (ලොවීම) යනාදිය ව්‍යඤ්ජන අවසානයට නිදර්ශනයි.
- ධාතුවෙන් පසුව 'ය' ප්‍රත්‍යය යෙදේ. (මෙම ප්‍රත්‍යය 'යඞ්' යන සාම්ප්‍රදායික නාමයෙන් හඳුන්වනු ලැබේ. එබැවින් යඞ්+අන්ත නම් වේ.)
- 'ය' ප්‍රත්‍යය යෙදෙන විගසම ධාතුව ද්විත්ව වේ. (හ්වාදි ගණයට අයත් ධාතුන් මෙන් වරනැගේ).

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
11 NOV 2017

- ඇතැම්විට 'ය' ප්‍රත්‍යය ලොප් වේ. (එය යඞන්ත ආඛ්‍යාතයේ වෙනත් වර්ගයක් බැවින් එය 'යඞ්ලුගන්ත' නමින් හැඳින්වේ.)

ඉහත විස්තරය අනුව පැහැදිලි වන්නේ මෙම අතිශයාර්ථ ආඛ්‍යාත ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන බවයි. එනම්

1. යඞන්ත
2. යඞ්ලුගන්ත වශයෙනි.

එම්. එච්. එෆ්. ජයසූරිය මහතා පෞනඃපුන්‍යාර්ථ (අතිශයාර්ථ) ආඛ්‍යාතයේ ඉහත දැක් වූ ප්‍රභේද ද්වය හඳුන්වන්නේ මෙසේය.

1. ද්විත්ව කළ ධාතුවෙන් පරව ආඛ්‍යාත විභක්ති යෙදේ. මෙය පරස්මෛ පදයේ හ්වාදි ගණික ධාතුවක් මෙන් වරනැගේ. එනම් පරස්මෛ පද පෞනඃපුන්‍යාර්ථ ආඛ්‍යාතයයි.

2. ද්විත්ව කළ ධාතුවෙන් පරව 'ය' ප්‍රත්‍යය යොදා අනතුරුව ආඛ්‍යාත ප්‍රත්‍යය යොදා ගැනේ. මෙය වරනැගෙන්නේ ආත්මනේ පදයෙහි පමණෙකි. එනම් ආත්මනේ පද පෞනඃපුන්‍යාර්ථ ආඛ්‍යාතයයි. එතුමාගේ මේ වර්ග කිරීම අනුව සාම්ප්‍රදායික නාමයන් පිළිවෙලින් යඞ්ලුගන්ත හා යඞන්ත වශයෙන් නම් යෙදීම ගැලපේ.

මෙහිදී ප්‍රථමයෙන් යඞන්ත ක්‍රියා පිළිබඳ විමසා බැලේ. එසේම ඒවායේ විශේෂ ලක්ෂණ කීපයක් සරළව මෙසේ දැක්විය හැක. එනම්

1. යඞන්ත (යඞ්+අන්ත) ආඛ්‍යාත
   - ✓ 'ය' ප්‍රත්‍යය (යඞ් යනු ඉත් අකුර සහිත 'ය' ප්‍රත්‍යයයි).

11 NOV 2017



- ✓ ප්‍රත්‍යය යෙදීම (ප්‍රත්‍යය භාවිතයත් සමග ඉත් අකුර (ඞ්) නොපෙනීයයි).
- ✓ ධාතු ද්විත්වය ('ය' ප්‍රත්‍යය යෙදීම සමගම ධාතුව ද්විත්වය වේ).
- ✓ පදය අවසානයේ ආත්මනේ පද ප්‍රත්‍ය පමණක් එකතුවේ. ඉහත ඉත් අකුරේ අර්ථය වන්නේ මෙම ආත්මනේ පද ප්‍රත්‍යයන් පමණක් ආඛ්‍යාත පදයට එකතුවීම හා ධාතුවේ ස්වර ගුණවීම දැක්වීමයි. (යඞ් සති ලුකි ච පූර්වස්‍ය නාමිනෝ ගුණෝ භවති. ස ධාතුඃ ඞිත්ත්වාදාත්මනේපදම්- සාරස්වත)
- ✓ මේ ආඛ්‍යාතයන්හි ද විකල්ප රූපයෝ වෙති.

යඞන්ත ආඛ්‍යාතයන්ට උදාහරණ මෙසේය.

| ධාතුව: | ලට් ක්‍රියාව: | යඞන්ත ක්‍රියාව: | අර්ථය: |
|---|---|---|---|
| ගම් | ගච්ඡති | ජඞ්ගම්‍යතේ (ග+ගම්+ය+තේ) | අතිශයින් යයි/ නැවත නැවත යයි. |
| දීප් | දීප්‍යතේ | දේදීප්‍යතේ (දී+දීප්+ය+තේ) | අතිශයින් බබළයි/ නැවත බබළයි. |
| නෘත් | නෘත්‍යති | නරීනෘත්‍යතේ (නෘ+නෘත්+ය+තේ) | අතිශයින් නටයි/ නැවත නටයි. |

මෙහිදී ආඛ්‍යාතයේ සාමාන්‍ය අර්ථය ඉක්මයා ගිය අර්ථයක් පවත්නා බව පැහැදිලි වියයුතුයි. එනම්

- ජඞ්ගම්‍යතේ යනු 'අතිශයින්/ නැවත නැවත යයි' වශයෙන් අර්ථ ගත යුතුවේ. සෙසු තන්හි ද එසේමය.

මෙතැන් සිට යඞන්ත ක්‍රියාවේ නිර්මාණය දක්වනු ලැබේ.

1. මේ ක්‍රියා විධියේදී ධාතුවට ද්විත්වය වීම පමණක් නොව ධාතුවේ මුලින් යෙදෙන පූර්ව අක්ෂරයට හෙවත් පූර්ව රූපයට දීර්ඝවීම, ගුණවීම ආදිය ද සාමාන්‍යයෙන් සිදුවේ.

- එම ස්වරය දීර්ඝවීම හෝ ගුණවීම හෝ සිදුවන්නේ මෙසේය.

ගුණවීම:

| ස්වර | ඉ, ඊ | උ, ඌ | ඍ, ඎ | ඏ, ඐ |
|---|---|---|---|---|
| ස්වර ගුණ | ඒ | ඕ | අර් | අල් |

- ස්වරයන්ගේ දීර්ඝවීම පහසුවෙන් දත හැක. එබැවින් එය මෙහි දක්වා නැත.

මීට අදාල වූ උදාහරණ මෙසේය. (දීර්ඝවීම)

| ධාතුව: | ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|
| පච් | පාපච්‍යතේ | අතිශයින්/නැවත නැවත පිසයි |
| පය් | පාපය්‍යතේ | අතිශයින්/ නැවත නැවත ඉගෙනගනියි |

ධාතුවේ පූර්වරූපයේ ගුණවීම මෙසේය:

| ධාතුව: | ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|
| චි | චේචීයතේ | අතිශයින්/ නැවත නැවත රැස්කරයි |
| දීප් | දේදීප්‍යතේ | අතිශයින්/ නැවත නැවත බබළයි |
| රු | රෝරූයතේ | අතිශයින්/ නැවත නැවත හඬයි |
| ලූ | ලෝලූයතේ | අතිශයින්/ නැවත නැවත කපයි |

- ධාතුවේ ස්වරය ඍ නම් 'රී' බවට ද, ඎ නම් 'ඊර්' බවට ද පත්වේ. (ඍ→ රී, ඎ→ඊර්)

| ධාතුව: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|
| කෘ | චේක්‍රීයතේ | අතිශයින්/ නැවත නැවත කරයි |
| හෘ | ජේහ්‍රීයතේ | අතිශයින්/ නැවත නැවත අත්හරියි |
| කෲ | චේකීර්යතේ | අතිශයින්/ නැවත නැවත විසුරුවයි |
| දෲ | දේදීර්යතේ | අතිශයින්/ නැවත නැවත පලයි |

- වර්ගාන්තයකින් (ඞ, ඤ, ණ, න, ම) ධාතුව අවසන් වේ නම් ධාතුවේ පූර්ව රූපයෙන් පසුව එම ධාතුවට අයත් මුල් අක්ෂරයට අයත් වර්ගාන්තයේ අනුනාසිකය ආගම වේ.

| ධාතුව: | පූර්වරූපය හා ආගම: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|---|
| ගම් | ජඞ් | ජඞ්ගම්‍යතේ | අතිශයින්/නැවත නැවත යයි |
| මන් | මම් | මම්මන්‍යතේ | අතිශයින්/ නැවත නැවත සිතයි |
| ජප් | ජඤ් | ජඤ්ජප්‍යතේ | අතිශයින්/ නැවත නැවත මතුරයි |
| හන් | ජඞ් | ජඞ්ඝන්‍යතේ | අතිශයින්/ නැවත නැවත නසයි |



- ඇතැම් ධාතූන් හා ධාතුවේ පූර්ව රූපය අතර 'න්' යන්නක් ආගම වේ.

| ධාතුව: | පූර්වරූපය හා ආගම: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|---|
| දහ් | දන් | දන්දහ්‍යතේ | අතිශයින්/ නැවත නැවත දවයි |
| දන්ශ් | දන් | දන්දශ්‍යතේ | අතිශයින්/ නැවත නැවත දෂ්ට කරයි |

- ඇතැම් ධාතූන් හා පූර්ව රූපය අතර 'නී' යන්නක් ආගම වේ.

| ධාතුව: | පූර්වරූපය හා ආගම: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|---|
| පද් | පනී | පනීපද්‍යතේ | අතිශයින්/ නැවත නැවත පැමිණෙයි |
| දන්ශ් | දනී | දනීදශ්‍යතේ | අතිශයින්/ නැවත නැවත දෂ්ට කරයි |
| පත් | පනී | පනීපත්‍යතේ | අතිශයින්/ නැවත නැවත වැටෙයි |
| වන්ච් | වනී | වනීවච්‍යතේ | අතිශයින්/ නැවත නැවත රවටයි |

- ඇතැම් ධාතූන්වලැ 'ඍ' උපධාව නිසා පූර්ව රූපයට පසුව 'රී' යන්නක්ද, සම්ප්‍රසාරණ රීතිය නිසා 'ඍ' බවට පත් වූ ස්වරයට පසුව 'රී' යන්නක් ද ආගම වේ. උපධාව නම් අවසන් වර්ණ මාත්‍රයට පූර්ව වූ ස්වරයයි. (අන්ත්‍යාත් පූර්ව උපධා- අන්ත්‍යාත් වර්ණමාත්‍රාත් පූර්වෝ යඃ ස උපධා සංඥෝ භවති- සාරස්වත). සම්ප්‍රසාරණ රීතිය නම් උච්චාරණය වෙනස්වීම අනුව ය, ර, ව යන අන්තස්ථයන් ඉ, ඍ, උ බවට පිළිවෙලින් පත්වීමයි. ඇතැම් පද උදාත්ත හෝ අනුදාත්ත වශයෙන් උච්චාරණය කෙරේ. ඒ අනුව ඉහත දැක් වූ ව්‍යඤ්ජනයන් ස්වර බවට පත් වන බැවින් ව්‍යාකරණඥයන් විසින් එය සම්ප්‍රසාරණ රීතිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

| ධාතුව: | පූර්වරූපය හා ආගම: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|---|
| වෘත් | වරී | වරීවෘත්‍යතේ | අතිශයින්/ නැවත නැවත පවතියි |
| නෘත් | නරී | නරීනෘත්‍යතේ | අතිශයින්/ නැවත නැවත නටයි |

| | | | |
|---|---|---|---|
| තෘප් | තරී | තරීතෘප්‍යතේ | අතිශයින්/ නැවත නැවත සතුටුවේ |
| ග්‍රහ් | ජරී | ජරීගෘහ්‍යතේ | අතිශයින්/ නැවත නැවත ගනියි |
| ප්‍රච් | පරී | පරීපෘච්ඡ්‍යතේ | අතිශයින්/ නැවත නැවත විමසයි |

- ඇතැම් ධාතූන්වලැ ස්වරයට 'ඊ' යන්නක් ආදේශ වේ.

| ධාතුව: | පූර්වරූපය: | ලට් ප්‍ර. පු. ඒක.: | අර්ථය: |
|---|---|---|---|
| දා | දේ | දේදීයතේ | අතිශයින්/ නැවත නැවත දෙයි |
| මා | මේ | මේමීයතේ | අතිශයින්/ නැවත නැවත මණියි |
| පා | පේ | පේපීයතේ | අතිශයින්/ නැවත නැවත බොයි |
| හා | ජේ | ජේහීයතේ | අතිශයින්/ නැවත නැවත අත්හරියි |

ඉහත දැක්වූ සියලු උදාහරණයන් අවබෝධ කරගැනීමට එම්. එච්. එෆ්. ජයසූරිය මහතා දක්වන නිදර්ශන (පි. 213) බැලීම ප්‍රයෝජනවත් වේ.

'කෘ' ධාතුවේ යඞන්ත රූපයන් දශ ලකාරයන්ට අයත් කොට කඳානේගෙදර පුඤ්ඤානන්ද හිමි (පි. 129) මෙසේ දක්වයි.

ලට්- චේකීර්යතේ (පුන පුනා/ අතිශයින් කරයි)

ලිට්- චේක්‍රීයාමාස

ලුට්- චේක්‍රීයිතා

ලෘට්- චේක්‍රීයිෂ්‍යතේ

ලෝට්- චේක්‍රීයතාම්

ලඞ්- අචේක්‍රීයත

විධිලිඞ්- චේක්‍රීයතේ

ආශීර්.ලි.- චේක්‍රීයිෂ්ට

ලුඞ්- අචේක්‍රීයිෂ්ට

ලෘඞ්- අචේක්‍රීයිෂ්‍යතේ

- මෙහිදී නැවතත් අවධානයට ගත යුතු වන්නේ ආත්මනේ පද ප්‍රත්‍යය පමණක් යඞන්ත ක්‍රියා සඳහා යෙදෙන බවයි. එසේම ඉහත නිදර්ශන ක්‍රියාවන්හි සියලු



අර්ථ 'කෘ' ධාතුවෙන් සිදුවන බව අවබෝධ කරගත යුතුවේ.

2. යඞ්ලුගන්ත (යඞ්+ලුක්+අන්ත) ආඛ්‍යාත

යඞන්ත ක්‍රියා සංඛ්‍යාවෙහිම තවත් ව්‍යතිරේකයක් ලෙස යඞ්ලුගන්ත ක්‍රියා විශේෂය දක්වා ඇත. එනම් මෙම යඞ්ලුගන්ත යනු අතිශයාර්ථ/ පෞනඃපුන්‍යය ක්‍රියා විෂයෙහි යෙදෙන 'ය' ප්‍රත්‍යය ලොප්වීමයි. එම ලොප්වීම ද ආර්ධ ධාතුක ලකාරවල ව්‍යඤ්ජන්තාන්ත ධාතූන් කෙරෙන් 'ය' ප්‍රත්‍යය ලොප්වීමයි. ව්‍යඤ්ජනාන්ත ධාතූන් පෙරදී දක්වා ඇති බැවින් මෙහිදී නිදර්ශන අවශ්‍ය නොවේ. ආර්ධ ධාතුක ලකාර යනු කුමක්දැයි මෙහිදී අවබෝධ කරගත යුතුවේ.

ප්‍රාචීන සංස්කෘත ව්‍යාකරණඥයන් දක්වන පරිදි ධාතූන් සමග විකරණයන් යෙදීම අනුව සියලුම ක්‍රියාංග (ධාත්වංග) කොටස් දෙකකට බෙදේ. එනම් අබ්විෂය හා අනබ්විෂය වශයෙනි. අබ්විෂයට අයත් වන්නේ ලකාර සතරෙකි (04). එනම් ලට්, ලඞ්, ලෝට් හා විධිලිඞ් යනුවෙනි. ඒවා සාර්වධාතුක ලකාර නමින් ද හැඳින්වේ. අනෙක් ලකාර (ලිට්, ලුට්, ලෘට්, ආශීර්ලිඞ්, ලුඞ්, ලෘඞ්) සයෙහිම විකරණ භේදයක් නැත. එබැවින් ඒවා අනබ්විෂය නමින් හැඳින්වේ. එසේම ඒවා ආර්ධධාතුක ලකාර නම් වේ.

මෙතෙක් දැක් වූ විස්තර අනුව යඞ්ලුගන්ත ක්‍රියාවේ සමස්ත ලක්ෂණ මෙසේ පෙන්වා දිය හැක.

✓ මේ ආඛ්‍යාත විශේෂයේ ලක්ෂණය නම් 'ය' ප්‍රත්‍යය ලුක් (ලොප්) වීමයි. එනම් ද්විත්ව වූ ධාතුව සමග සෘජුවම ති (තිබාදි) ආදී ලකාර ප්‍රත්‍යයෝ එකතුවෙති.

- ✓ අදාළ ද්විත්ව වූ ධාතුව හා ති ආදී ප්‍රත්‍යයන් අතරට 'ඉ' ස්වරය ඇතැම්විට ආගම වේ.
- ✓ පරස්මෛ පදයේ ප්‍රත්‍යයන් පමණක් එකතු වී පරස්මෛ පදයෙහි පමණක් වරනැගේ.
- ✓ සාරස්වතයෙහි ඉහත ලක්ෂණ 'යඞ්ලුගන්තං පරස්මෛපදං හ්වාදිවච්ච ද්‍රෂ්ටව්‍යම්. හ්වාදිවත්ත්වාදපෝ ලුග්, ද්විත්වමපි ඥාතව්‍යම්- යඞ්ලුගන්ත ධාතුරූපය පරස්මෛපද වේ, ජුහෝත්‍යාදිය මෙන් සැලකිය යුතුයි. හ්වාදිය මෙන් වන නිසා 'ය' විකරණයට ලුක් වේ' යැයි දක්වා ඇත.
- ✓ මේ ආඛ්‍යාතයන්හි ද විකල්ප රූපයෝ වෙති.
- ✓ යඞ්ලුගන්ත ක්‍රියා විශේෂයට 'චර්කරීත' නම් පෞරාණික නාමයක් ද වන බව ශ්‍රී පියරතන නාහිමියෝ (පි. 192) දක්වති.

යඞ්ලුගන්ත ආඛ්‍යාත සඳහා උදාහරණ මෙසේය.

| ධාතුව: | ලට්ක්‍රියාව: | යඞ්ලුගන්ත ක්‍රියාව | අර්ථය: |
|---|---|---|---|
| ගම් | ගච්ඡති | ජඞ්ගමීති (ජ+ගම්+ඉ+ති) | අතිශයින්/ නැවත නැවත යයි |
| දීප් | දීප්‍යති | දේදීප්ති (දි+දීප්+ති) | අතිශයින්/ නැවත නැවත බබළයි |
| නෘත් | නෘත්‍යති | නරීනර්ති (නෘ+නෘත්+ති) | අතිශයින්/ නැවත නැවත නටයි |
| වෘත් | වර්තති | වරීවර්ත්ති (වෘ+වෘත්+ති) | අතිශයින්/ නැවත නැවත පවතියි |

සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණියෙහි (පි. 351-352) යඞ්ලුගන්ත ආඛ්‍යාත නිර්මාණ විධියේ ලක්ෂණ කීපයක් දක්වා ඇත. ඒවා මෙසේය.

- පද සිද්ධියේදී ප්‍රත්‍යයට පෙර 'ඊ' යන්නක් විකල්පයෙන් ආගම වේ.



| ධාතුව: | යඞ්ලුගන්ත ක්‍රියාව | අර්ථය: |
|---|---|---|
| පච් | පාපචීති/ පාපක්ති | අතිශයින්/ නැවත නැවත පිසයි |
| භූ | බෝභවීති/ බොභෝති | අතිශයින්/ නැවත නැවත සිදුවෙයි |
| රු | රෝරවීති/ රෝරෝති | අතිශයින්/ නැවත නැවත ශබ්ද කරයි |

මේ පද සිද්ධිය සම්බන්ධයෙන් විද් ධාතුවේ ආදර්ශ වරනැගීමක් එම්. එච්. එෆ්. ජයසූරිය මහතා විසින් (පි. 211) දක්වා ඇත. එයින් වර්තමාන කාලය (ලට්) පමණක් මෙහි උපුටා දැක්වේ.

| | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර. පු. | වේවෙත්ති/වේවිදීති | වේවිත්තස් | වේවිදති |
| ම. පු. | වේත්සි/ වේවිදීති | වේවිත්ථස් | වේවිත්ථ |
| උ. පු. | වේවේද්මි/ වේවිදීමි | වේවිද්වස් | වේවිද්මස් |

(අතිශයින්/නැවත නැවත දනිමු )

මෙහිදී අවබෝධ කරගත යුතු වන්නේ මෙය විකල්ප විධියක් බැවින් රූපයන්හි වෙනස්කම් පවතින බවයි.

- ඍකාරාන්ත හෝ ඍකාරය උපධා කොට ඇති ධාතුන්ගේ පූර්ව රූපයට පරව ර්-රි-රී අක්ෂරයන් විකල්ප වශයෙන් ආගම වේ. (උපධා යන්න ඉහත විස්තර කොට ඇත).

| ධාතුව: | යඞ්ලුගන්ත ක්‍රියාව | අර්ථය: |
|---|---|---|
| කෘ | චර්කරීති/චර්කර්ති | අතිශයින්/ නැවත නැවත කරයි |
| වෘත් | වර්වෘතීති/ වරීවර්ති | අතිශයින්/ නැවත නැවත පවතියි |

යඞ්ලුගන්ත ආඛ්‍යාත විශේෂයට අයත් ලිහ් ධාතුවේ දශ ලකාර රූප පුඤ්ඤානන්ද හිමි (පි. 129) මෙසේ දක්වයි.

ලට්- ලේලේඪි (ලි+√ලිහ්+ති) (අතිශයින්/ නැවත නැවත ලොවයි)

ලිට්- ලේලිහාමාස/ලේලියාම්බභූව/ලේලියාඤ්චකාර (අතිශයින් ලෙවීය)
ලි+√ලිහ්+ආස/බභූව/+ආම් චකාර

ලුට්- ලේලේහිතා (අතිශයින් හෙට ලොවන්නේය)- ලි+√ලිහ්+තා

ලෘට්- ලේලේහිෂ්‍යති (අතිශයින් මතු ලොවන්නේය)- ලි+√ලිහ්+ස්‍යති

ලෝට්- ලේලේඪු (අතිශයින් ලොවිය යුත්තේය)- ලි+√ලිහ්+තු

ලඞ්- අලේලේට් (අතිශයින් ලෙවීය)- අ+ලි+√ලිහ්+ත්

විධිලි- ලේලිහ්‍යාත් (අතිශයින් ලෙවිය යුතුයි)- ලි+√ලිහ්+යාත්

ආශිර්.ලි- ලේලිහ්‍යාත් (අතිශයින් ලෙවිය යුත්තේය)- ලි+√ලිහ්+යාත්

ලුඞ්- අලේලිහීත් (අතිශයින් ලෙවීය)- අ+ලි+√ලිහ්+ත්

ලෘඞ්- අලේලේහිෂ්‍යත් (අතිශයින් ලොවන්නේ නම්/ ලෙවී නම්)-
අ+ලි+√ලිහ්+ස්‍යත්

ඉහත විස්තර කොට ඇති බොහෝ ආඛ්‍යාත රූපයන්හි විකල්ප රූප දක්නට ඇතත් ඒ සියල්ල මෙහි දක්වා නැත.

සංස්කෘත භාෂාවේ කලාතුරකින් යෙදෙන ආඛ්‍යාත පද විශේෂයන් වුවද ඉහත දැක් වූ යඞන්ත හා යඞ්ලුගන්ත ක්‍රියා පද දෙවගීයේ ලක්ෂණ ඉහත පරිදි විස්තර කළ හැක.



## ආන්තික සටහන්


1. සාරස්වත- චතුර්ථ භාගය. (පරි.). බද්දේගම ශ්‍රී ප්‍රියරත්න නාහිමි. කලුතරඃ විද්‍යාතිලක මුද්‍රණාලය. 1941,පි. 173-199

2. ජයසූරිය, එම්. එච්. එෆ්., සංස්කෘත ශික්ෂකය ද්විතීය භාගය. කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 1971. පි. 209-218

3. ධම්මින්ද නාහිමි, හැගොඩ., සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී (ආඛ්‍යාත කෘදන්ත), කොළඹඃ විද්‍යෝදය පිරිවෙණේ ආදි ශිෂ්‍ය සංගමය. 1999, පි. 345-354

4. පුඤ්ඤානන්ද හිමි, කඳානේගෙදර., සංස්කෘත ව්‍යාකරණ ශික්ෂා. කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. 1961. පි. 128-129

5. ප්‍රේමරතන හිමි, වරාගොඩ., සංස්කෘත නාමාඛ්‍යාත විවරණය. කොළඹඃ සමයවර්ධන පොත්හල (පුද්) සමාගම. 2004. පි. 185-187

6. සේනාධීර, පණ්ඩිත ගුණපාල., (පරි.). ආධුනික සංස්කෘත ව්‍යාකරණය. කොළඹඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. 1964. පි. 142-144

7. Macdonell. A. Arthur., A Sanskrit Grammar for Students. India: Motilal Banarsidas Publishers. 1997. P. 142-143


11 NOV 2017
පුස්තකාලය